# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2016 අප්‍රේල් මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

(2016.04.18 දින නිකුත් කරන ලදී)


# හෝමියෝපති

**හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම සඳහා ද, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් සහ හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සඳහා ද, හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීම සඳහා ද, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම, පෝෂණය කිරීම සහ නියාමනය කිරීම සඳහා මෙන්ම හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ අනෙකුත් හෝමියෝපති පිළියෙල කිරීම් නිෂ්පාදනය, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදාහැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා ද, 1970 අංක 7 දරන හෝමියෝපති පනත ඉවත් කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 26.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

# හෝමියෝපති

එල්.ඩී.—ඕ. 46/2005

**හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම සඳහා ද, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් සහ හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සඳහා ද, හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීම සඳහා ද, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම, පෝෂණය කිරීම සහ නියාමනය කිරීම සඳහා මෙන්ම හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ අනෙකුත් හෝමියෝපති පිළියෙල කිරීම් නිෂ්පාදනය, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදාහැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා ද, 1970 අංක 7 දරන හෝමියෝපති පනත ඉවත් කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

1. මේ පනත 2016 අංක දරන හෝමියෝපති පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් හඳුන්වනු ලබන ) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම

හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම.

2. (1) (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) හෝමියෝපති වෛද්‍ය සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සභාව (I) වන උපවගන්තිය යටතේ තමා වෙත පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු සහ ස්වකීය නාමයෙන්, එය විසින් හා එයට එරෙහිව නඩු පැවරීම සහ පවරනු ලැබීම ද යම් චංචල හෝ නිශ්චල දේපළ ස්වකීය නාමයෙන් දැරීම, අත්කර ගැනීම හෝ බැහැර කිරීම ද කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් මණ්ඩලය සමන්විත විය යුතු ය:—

(අ) නිල බලයෙන් පත් වන සාමාජිකයන් , එනම් -

(i) මේ පනතේ 19 වන වගන්තිය යටතේ පත් කරනු ලබන විධායක අධ්‍යක්ෂවරයා ;

(ii) අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා හෝ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුට නොඅඩු තනතුරක් දරන නිලධරයකු;

(iii) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද භාණ්ඩාගාරයේ නියෝජිතයකු;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා විසින් නම් කරන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයකු.

(ආ) 6 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයින් අතරින් තෝරාගත යුතු සාමාජිකයින් හතර දෙනකු;

(ඇ) පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් දෙදෙනකුවත් හෝමියෝපති වෘත්තිකයින් අතරින් විය යුතු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් තුන් දෙනකු.

සභාවේ සාමාජිකයකු ලෙස තෝරාගැනීමට හෝ පත් කරනු ලැබීමට ඇති නුසුදුසුකම්.

3. සභාවේ සාමාජිකයකු වශයෙන් තෝරා ගැනීමට හෝ පත් කර ගැනීම සඳහා යම් තැනැත්තකු පහත දැක්වෙන හේතු මත නුසුදුසු වන්නේ ය:—

(අ) ඔහු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු වන්නේ නම් හෝ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හෝ සාමාජිකයකු බවට පත් වන්නේ නම්; හෝ

(ආ) ඔහු වයස අවුරුදු විසිපහට වඩා අඩු තැනැත්තකු වන්නේ නම්; හෝ

(ඇ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කොට හෝ ප්‍රකාශ කොට ඇති තැනැත්තකු වේ නම්; හෝ

(ඈ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ බංකොලොත් හෝ බුන්වත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබූ තැනැත්තකු වේ නම්; හෝ

(ඉ) ඔහු සභාවේ සේවා නියුක්තයකු වන්නේ නම් ; හෝ

(ඊ) ඔහු චරිත දූෂණ වරදක් සඳහා නිසි අධිකරණයක් විසින් වරදකරුවකු කරනු ලැබ ඇත්නම්; හෝ

(උ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකුව සිටීම අවසන් වුවහොත් ; හෝ

(ඌ) ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයකු වීම නතර වන්නේ නම්.

සාමාජිකයින් ධුරයෙන් ඉවත් කිරීම.

**4.** (1) අමාත්‍යවරයා හට නිල බලයෙන් පත් වූ සාමාජිකයන් හැර වෙනත් ඕනෑම සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(2) එවැනි සෑම ඉවත් කිරීමක් පිළිබඳව ම *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු ය.

සභාවේ සාමාජිකයන් විසින් ධුරය හිස් කිරීම.

**5.** නිල බලයෙන් පත්වන සාමාජිකයකු හැර සභාවේ සාමාජිකයකු —

(අ) සභාවේ මතය අනුව ප්‍රමාණවත් හේතුවක් නොමැතිව සභාවේ අඛණ්ඩ රැස්වීම් වාර තුනකට සහභාගි නොවී ඇත්නම්;

(ආ) ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයකු වීම අවසන් වී ඇති අවස්ථාවක;

(ඇ) අමාත්‍යවරයා විසින් ලිඛිතව ඉල්ලා අස්වීම පිළිගෙන ඇති අවස්ථාවක;

(ඇ) සිය ධුර කාලය අවසන් වී ඇත්නම්;

(ඉ) පනත යටතේ අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම්;

(ඊ) 3 වන වගන්තියේ සඳහන් යම් නුසුදුසුකම්වලට යටත් වීම නිසා,

ඔහු සිය ධුරය හිස් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

2(3) (ආ) වගන්තියේ කාර්යය සඳහා සාමාජිකයන් තෝරා ගැනීම.

**6.** අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2 (3) (ආ) වගන්තියේ කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි ආකාරයට ඡන්ද විමසීමක් පැවැත්විය යුතු ය.

සභාපතිවරයා සහ උප සභාපතිවරයා පත් කිරීම.

**7.** (1) නියම කරනු ලැබිය හැකි ආකාරයට සභාවේ සාමාජිකයන් විසින්, ඔවුන් අතුරින් ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විය යුතු සභාපතිවරයකු සහ උප සභාපතිවරයකු තෝරා පත් කරනු ලැබිය යුතු ය.

(2) සභාව සඳහා සාමාජිකයන් තෝරාපත් කර ගැනීම සම්බන්ධයෙන් යම් ගැටලුවක් පැන නඟින අවස්ථාවක එය අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, එවැනි කරුණක් පිළිබඳ ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

සභාපතිවරයා ආදීන් ඉල්ලා අස්වීම.

**8.** නිල බලයෙන් පත් වූ සාමාජිකයන් හැර සභාවේ සභාපතිවරයා, උප සභාපතිවරයා හෝ කිසියම් සාමාජිකයකු හට අමාත්‍යවරයා වෙත අමතන ලද ලිපියක් මඟින් ඕනෑම අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එවැනි ඉල්ලා අස්වීමක් අමාත්‍යවරයා විසින් පිළිගත් දිනයේ සිට බලාත්මක විය යුතු ය.

සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

**9.** (1) සභාවේ නිල බලයෙන් පත් වන සෑම සාමාජිකයකු ම තමාගේ ධුරය ප්‍රකාරව ධුරය දරන තාක් කල් සභාවේ සාමාජිකයකු වශයෙන් ධුර දරනු ලැබිය යුතු ය.

(2) මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා සභාපතිවරයා, උපසභාපතිවරයා හෝ සභාවේ යම් සාමාජිකයකු විසින් කලින් ධුරය හිස් කළහොත් මිස අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුතු ය:

එසේ වුව ද, ධුරය හිස් කරන ලද සාමාජිකයකු වෙනුවෙන් පත් කරන ලද හෝ නම් කරන ලද සාමාජිකයකු විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයේ ඉකුත් නොවූ කාලය සඳහා ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද, තව දුරටත් එවැනි සාමාජිකයකු එලෙස දරන ලද ඉකුත් නොවූ ධුර කාලය 2 වන වගන්තිය යටතේ එවැනි සාමාජිකයකු නැවත පත් කිරීමේ හෝ තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා සම්පූර්ණ ධුර කාලයක් ලෙස නොසැලකිය යුතු ය.

(3) සභාවේ සාමාජිකයකු සිය ධුරයෙන් ඉවත් කර නැති නම් ඔහු අනුගාමී කාල සීමා දෙකක් සඳහා සභාවට නැවත තෝරා ගැනීමට හෝ නැවත පත් කිරීමට යෝග්‍ය විය යුතු ය.

(4) සභාවේ කාලය ඉකුත් වීමට යටත් පිරිසෙයින් මාස තුනකටවත් පෙර සභාවේ සාමාජිකයින් තෝරා ගැනීම හෝ පත් කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

සභාවේ රැස්වීම්.

**10.** (1) සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථා වල දී සහ ස්ථානවල දී යටත් පිරිසෙයින් මාස තුනකට වරක්වත් සභාව විසින් රැස්වීම් පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා විසින් සභාවේ ඕනෑම රැස්වීමක මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා නොපැමිණි අවස්ථාවල දී උපසභාපතිවරයා විසින් ද, සභාපතිවරයාත් උපසභාපතිවරයාත් යන දෙදෙනාම නොමැති අවස්ථාවල දී පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තෝරා ගන්නා ලද සාමාජිකයකු ද මුලසුන දරනු ලැබිය යුතු ය.

(3) ඕනෑම රැස්වීමක ගණපූරණය, සාමාජිකයන් හත් දෙනෙකු විය යුතු ය.

(4) ඕනෑම රැස්වීමක දී තීරණය කිරීම සඳහා ඇති සියලුම ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(5) සභාවේ යම් රැස්වීමක ඡන්දය සමාන වූ අවස්ථාවක, සභාපතිවරයා, උපසභාපතිවරයා හෝ එම රැස්වීමෙහි මුලසුන දරන සාමාජිකයන් හට සිය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(6) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, සභාව විසින් එහි රැස්වීම් සහ එවැනි රැස්වීම්වල කටයුතු පිළිබඳ කාර්ය පටිපාටිය ක්‍රමවත් කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

රැස්වීම් කටයුතුවල වාර්තා.

11. (1) සභාවේ සෑම රැස්වීමක ම එහි කටයුතු පිළිබඳ වාර්තා මේ පනතේ කාර්යය සඳහා තබා ඇති පොතක ඇතුළත් කරනු ලැබිය යුතු අතර, රැස්වීමේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) සභාවේ සෑම රැස්වීමක ම එහි කටයුතු පිළිබඳ වාර්තාවේ පිටපතක් රැස්වීමේ දින සිට දින දාහතරක් ඇතුළත අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවීම.

12. මුදල් විෂයය පවරා ඇති අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ එවැනි අනුප්‍රමාණ අනුව සභාවේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

යම් පුරප්පාඩුවක් පැවතීම හේතු කොටගෙන සභාවේ ක්‍රියා, තීරණ හෝ කටයුතු අවලංගු නොවන බව.

13. සභාවේ සාමාජිකයින් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එයට සාමාජිකයින් පත් කිරීමේ හෝ තෝරා පත් කිරීමේ හෝ එහි සංයුතිය පිළිබඳ යම් දෝෂයක් තිබීමේ හේතුව මත සභාවේ ක්‍රියා, තීරණ හෝ කටයුතු අවලංගු නොවිය යුතු ය.

සභාවේ මුද්‍රාව.

14. සභාවේ මුද්‍රාව—

(අ) පනතේ 18 වන වගන්තිය යටතේ පත් කරන ලද සභාවේ රෙජිස්ට්‍රාර්වරයාගේ භාරයේ තැබිය යුතු ය;

(ආ) සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කළ හැකි ය;

(ඇ) සභාවේ රෙජිස්ට්‍රාර්වරයා සහ එහි සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඔවුන් සියලු දෙනා තමන් පැමිණ සිටින බවට සළකුණක් වශයෙන් සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

## II වන කොටස

### සභාවේ අරමුණු සහ බලතල

**15.** පහත සඳහන් දේ සභාවේ අරමුණු විය යුතු ය :— සභාවේ අරමුණු.

(අ) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම සහ නියාමනය කිරීම;

(ආ) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව මහජන සෞඛ්‍ය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව සමාජය තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම, පර්යේෂණ කිරීම සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම, ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම;

(ඈ) හෝමියෝපති ආයතනයන් පිහිටුවා පවත්වාගෙන යාම;

(ඉ) රජයේ හෝමියෝපති ශික්ෂණ රෝහලට අමතරව හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සහ පාලනය කිරීම; සහ

(ඊ) හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ වෙනත් පිළියෙල කිරීම් නිෂ්පාදනය, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදා හැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම.

**16.** සභාවට පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් බලතල තිබිය යුතු යඃ- සභාවේ බලතල.

(අ) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්, හෝමියෝපති ඖෂධවේදීන්, හෝමියෝපති හෙදියන් සහ හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම;

(ආ) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත වූ හෝමියෝපති වෛද්‍ය ආයතන විසින් ප්‍රදානය කරන හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ වෛද්‍ය

සුදුසුකම් පිළිගැනීම සහ එවැනි පිළිගැනීමක් ලබා දිය යුතු ද ප්‍රතික්ෂේප කළ යුතු ද යන්නට අදාළ අවස්ථා තීරණය කිරීම;

(ඇ) යම් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ වෛද්‍ය ආයතනයක් විසින් හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ වෛද්‍ය සුදුසුකම් ප්‍රදානය කරනු ලබන්නා වූ අධ්‍යයන පාඨමාලා, විභාග හෝ වෙනත් කිසියම් කාරණයක් සම්බන්ධයෙන් එකී විශ්වවිද්‍යාලයෙන් හෝ වෛද්‍ය ආයතනයෙන් තොරතුරු විමසීම;

(ඈ) හෝමියෝපති ආයතන විසින් අවශ්‍ය ප්‍රමිති පවත්වාගනු ලබන්නේදැයි යන්න සහතික කර ගැනීම සඳහා එම ආයතන අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂකවරුන් පත් කිරීම;

(ඉ) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව රෝග සඳහා ප්‍රතිකාර කිරීමට අවශ්‍ය සේවා සැපයීම;

(ඊ) හෝමියෝපති ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ හෝමියෝපති පිළිබඳ පශ්චාත් අධ්‍යයන පාඨමාලා සකස් කිරීම;

(උ) අවස්ථාවෝචිත පරිදි රෝහල්, බෙහෙත් ශාලා , මධ්‍යස්ථාන, ඔසුහල් සහ ඒ සම්බන්ධ ආයතන හෝ ස්ථාන පිහිටුවා පවත්වා ගෙනයාම හෝ හෝමියෝපති ප්‍රතිකාර පිළියෙල කිරීම් වලට සහ ලබා දීමට අවශ්‍ය හෝමියෝපති ඖෂධ ආනයනය හෝ අපනයනය කිරීම;

(ඌ) හෝමියෝපති ඖෂධ විද්‍යාත්මකව නිෂ්පාදනය කිරීම දිරිමත් කිරීම;

(එ) හෝමියෝපති වෛද්‍ය විද්‍යාල සහ අනෙකුත් හෝමියෝපති ආයතන මගින් සපයනු ලබන වෛද්‍ය අධ්‍යාපනයට සම්බන්ධ අධ්‍යයන පාඨමාලා, විභාග, කාර්ය මණ්ඩලය, උපකරණ, නවාතැන්, පුහුණුව, රෝහල් සහ අනෙකුත් පහසුකම් පිළිබඳ අවම ප්‍රමිති නියම කිරීම සහ පවත්වා ගෙන යාම;

(ඒ) විශේෂයෙන් තරුණයින් ඇතුළුව සුදුසු තැනැත්තන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් ප්‍රදානය කිරීම මගින් හෝමියෝපති වෛද්‍ය විද්‍යා ක්‍රමය අධ්‍යයනය කිරීම සඳහා සහ පර්යේෂණ පැවැත්වීම සඳහා උනන්දු කරවීම සහ හෝමියෝපති වෛද්‍ය විද්‍යාව සඳහා අධ්‍යයන පාඨමාලා පවත්වනු ලබන වෙනත් ආයතන සඳහා හෝ පර්යේෂණවල යෙදී සිටින ආයතන සඳහා මූල්‍යමය ආධාර සහ වෙනත් සහායන් ලබා දීම;

(ඔ) පශ්චාත් උපාධි හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ වෛද්‍ය අධ්‍යාපන අවම ප්‍රමිති නියම කිරීම සහ පවත්වාගෙන යාම;

(ඕ) රෝග අධ්‍යයනය කිරීම, රෝග සඳහා ප්‍රතිකාර කිරීම සහ රෝග වැළැක්වීම සඳහා අවශ්‍ය වන්නේ යම් පියවර ද ඒ පියවර වර්ධනය කිරීම සහ ඒ සඳහා උනන්දු කරවීම සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව මහජන සෞඛ්‍ය වැඩි දියුණු කිරීම;

(ක) හෝමියෝපති වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ උපාධි සහ අනෙකුත් අධ්‍යයන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා උසස් අධ්‍යාපනික ආයතන සමග කටයුතු කිරීම;

(ග) උසස් අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ච) සභාවේ කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි මණ්ඩල සහ කමිටු අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පිහිටුවීම;

(ජ) සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා රීති සෑදීම; සහ

(ට) සභාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලු දේ කිරීම හෝ මේ පනත යටතේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

රීති සෑදීම සඳහා සභාව සතු බලතල.

**17.** (1) මෙම පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව සභාව විසින්—

(i) සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය බවට සැලකිය හැකි පරිදි කාර්ය මණ්ඩලය කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ii) කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම;

(iiii) කාර්ය මණ්ඩලයේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම;

(iv) කාර්ය මණ්ඩලයේ යහපත පිණිස අර්ථ සාධක අරමුදල් හෝ විශ්‍රාම යෝජනා ක්‍රම පිහිටුවීම හා නියාමනය කිරීම සහ එවැනි යම් අරමුදල් සහ යෝජනා ක්‍රම සඳහා දායක වීම; සහ

(v) සභාවේ දේපළ කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලුම කාරණා හෝ කිසියම් කාරණයක් සම්බන්ධයෙන් සභාව හට රීති සෑදිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය පළ වූ දින සිට හෝ එම දිනයට පසුව එන මෙහි නිශ්චිතව දැක්විය හැකි දිනයක සිට බලාත්මක විය යුතු ය.

සභාවේ රෙජිස්ට්‍රාර්වරයා සහ වෙනත් නිලධරයන් සහ සේවා නියුක්තිකයන්.

**18.** (1) සභාව විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව -

(අ) සභාවේ ලේකම්වරයා ලෙස ද කටයුතු කරනු ලැබිය යුතු රෙජිස්ට්‍රාර්වරයකු;

(ආ) මේ පනත යටතේ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් සහ සේවා නියුක්තිකයන්,

පත් කරනු ලැබිය යුතු ය.

(2) මෙම වගන්තිය යටතේ පත්කළ සහ සේවයේ නියුක්ත කළ සියලුම තැනැත්තන් දණ්ඩ නීති සංග්‍රහයේ 19 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය.

## III වන කොටස

### විධායක අධ්‍යක්ෂවරයා

විධායක අධ්‍යක්ෂවරයා පත් කිරීම.

**19.** (1) අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ රජයේ නිලධරයකු (මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් හඳුන්වනු ලබන) විධායක අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කළ යුතු අතර, ඔහු සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) (අ) සභාවේ බලතල සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් නිලධරයන් යම් ප්‍රමාණයක් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) මෙම වගන්තියේ කාර්ය සඳහා (අ) ඡේදය යටතේ පත් කරනු ලබන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් නිලධරයන් රජයේ සේවකයින් විය යුතු ය.

(ඇ) මේ පනත යටතේ ස්වකීය බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී , විධායක අධ්‍යක්ෂවරයා අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු අතර සභාවට වගකිව යුතු ය.

(ඈ) අධ්‍යක්ෂවරයා විසින් යම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු වෙත යම් බලතල හෝ කාර්ය පවරා දෙනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂවරයාගේ කර්තව්‍යයන්.

**20.** අධ්‍යක්ෂවරයා විසින් සභාවේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන කර්තව්‍යයන් ඉටු කරනු ලැබිය යුතු ය:—

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළත්ව මෙම පනතේ විධිවිධාන පරිපාලනය කිරීම;

(ආ) සභාවේ තීරණ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් වගකීම දැරීම; සහ

(ඇ) සභාව විසින් අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබිය හැකි සියලු කාර්යයන් ඉටු කිරීම.

මුදල් ගෙවනු ලැබිය හැකි කාරණා.

**21.** සභාව විසින් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව සහ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා පහත සඳහන් කාරණා සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන මුදල් ප්‍රදානය කරනු ලැබිය හැකි ය:—

(අ) සභාවේ පරිපාලනය හා සම්බන්ධව ඇති වියදම් පියවා ගැනීමේ කාර්ය සඳහා;

(ආ) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා පිහිටුවා ඇති සහ පවත්වාගෙන යනු ලබන කිසියම් ආයතන සඳහා;

(ඇ) අධ්‍යයන පාඨමාලා පවත්වාගෙන යන්නා වූ හෝ හෝමියෝපති ඖෂධ පිළිබඳ පර්යේෂණවල යෙදී සිටින්නා වූ ආයතන සඳහා;

(ඈ) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවනු ලැබූ හෝ පවත්වාගෙන යනු ලබන වෙනත් යම් ආයතන සඳහා; සහ

(ඉ) හෝමියෝපති වෛද්‍ය විද්‍යාව අධ්‍යයනය කිරීම සිදු කරගෙන යාම සඳහා පිළිගත් ආයතන වල යම් කුසලතා සහිත සුදුසු ශිෂ්‍යයින්ට ශිෂ්‍යත්ව සහ දීමනා ප්‍රදානය කිරීම සඳහා.

## IV වන කොටස

### හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ හෝමියෝපති ආයතන පිහිටුවීම

සභාව නොවන වෙනත් තැනැත්තන් විසින් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ හෝමියෝපති ආයතනයක් පිහිටුවීම.

**22.** (1) කිසිම තැනැත්තකු විසින් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ සභාවේ පූර්ව අනුමතයක් නොමැතිව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ හෝමියෝපති ආයතනයක් පිහිටුවනු නොලැබිය යුතු ය.

(2) අනුමත හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ හෝමියෝපති ආයතනයක් -

(i) උපාධි,ඩිප්ලෝමා හෝ වෙනත් යම් හෝමියෝපති වෛද්‍ය සුදුසුකමක් පිරිනැමීමේ හෝ ප්‍රදානය කිරීමේ අරමුණින් පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා හෝ පුහුණු පාඨමාලා ඇතුළත්ව හෝමියෝපති වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ නව හෝ උසස් අධ්‍යාපන පාඨමාලා හෝ පුහුණු පාඨමාලා ආරම්භ කිරීම ; හෝ

(ii) උපාධි, ඩිප්ලෝමා හෝ වෙනත් යම් හෝමියෝපති වෛද්‍ය සුදුසුකමක් පිරිනැමීමේ හෝ ප්‍රදානය කිරීමේ අරමුණින් පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා හෝ පුහුණු පාඨමාලා ඇතුළත්ව හෝමියෝපති වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ යම් උපාධි පාඨමාලා හෝ පුහුණුව සඳහා බඳවා ගන්නා වූ ප්‍රමාණය වැඩි කිරීම;

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ සභාවේ පූර්ව අනුමතය ඇතිව මිස සිදු නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් යම් පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාවක් හෝ පුහුණුවක් ඇතුළත් සෑම අධ්‍යයන පාඨමාලාවක් හෝ පුහුණුවක් ම 27 වන වගන්තියේ සඳහන් අවම අධ්‍යාපන ප්‍රමිතීන් සමඟ අනුකූල විය යුතු ය.

(4) මෙම වගන්තියේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට පටහැනිව ක්‍රියා කරන ඕනෑම තැනැත්තෙකු වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු රුපියල් පනස්දහසකට නොඅඩු දඩයකට හෝ මාස හයක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ එම බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධානවලට අමතරව (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් ක්‍රියාව සිදු කිරීම හෝ නොකඩවා සිදු කිරීම වැළැක්වීම සඳහා සභාව විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ XLVIII අධිකාරයේ විධිවිධාන අනුව දිස්ත්‍රික් අධිකරණයක නඩුවක් ගොනු කරනු ලැබිය හැකි ය.

(6) මෙම වගන්තියේ සඳහන් වරද සිදුකරනු ලබන තැනැත්තා පුද්ගල මණ්ඩලයක් වන අවස්ථාවක-

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකු ම; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් එම ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු සහ නිලධරයකු ම,

එම වරදට වරදකරුවකු වශයෙන් සැලකිය යුතු ය:

එසේ වුව ද, එම වරද සිදු කරනු ලැබුවේ තමාගේ අනුදැනුම නොමැතිව බවට හෝ එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට එම අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ හවුල්කරු ඔප්පු කරන්නේ නම්, එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ ව්‍යාපාර ආයතනයේ හවුල්කරු හෝ නිලධරයා වරදකරුවකු ලෙස සලකනු නොලැබිය යුතු ය.

## V වන කොටස

### හෝමියෝපති වෛද්‍ය සුදුසුකම් පිළිගැනීම

ශ්‍රී ලංකාවේ දී ප්‍රදානය කරන ලද හෝමියෝපති වෛද්‍ය සුදුසුකම් පිළිගැනීම.

**23.** (1) ශ්‍රී ලංකාවේ යම් පිළිගත් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ යම් හෝමියෝපති වෛද්‍ය ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද හෝ පිරිනමන ලද යම් හෝමියෝපති වෛද්‍ය සුදුසුකමක් , (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාව විසින් පිළිගනු ලැබිය හැකිය.

(2) (අ) ඒ හෝමියෝපති විද්‍යාලය හෝ හෝමියෝපති ආයතනය විසින් සපයනු ලබන සහ හෝමියෝපති වෛද්‍ය විද්‍යා සුදුසුකමක් ප්‍රදානය කිරීමට හෝ පිරිනැමීමට හේතුවන අධ්‍යයන පාඨමාලා ; හෝ

(ආ) එවැනි යම් වෛද්‍ය විද්‍යා සුදුසුකමක් ප්‍රදානය කිරීමේ හෝ පිරිනැමීමේ කාර්ය සඳහා එම විද්‍යාල හෝ ආයතන මගින් පවත්වනු ලබන යම් විභාග සම්බන්ධයෙන් නියම කරනු ලබන ප්‍රවීනතා මට්ටම; හෝ

(ඇ) ඒ අධ්‍යයන පාඨමාලා සඳහා එම විද්‍යාලය හෝ ආයතනය මඟින් සපයනු ලබන කාර්ය මණ්ඩලය, උපකරණ, නවාතැන් සහ පහසුකම්,

27 වන වගන්තියේ සඳහන් කරන ලද නියම කරනු ලබන අවම අධ්‍යාපන ප්‍රමිතීන් සමග අනුකූල වන්නේ දැයි දැනගැනීමේ කාර්යය සඳහා සභාව විසින් යම් පරීක්ෂණ, විමර්ශන සහ විමසීම් (1) වන උපවගන්තියේ සඳහන් හෝමියෝපති විද්‍යාලය හෝ ආයතනය සම්බන්ධයෙන් පවත්වනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ එම පරීක්ෂණ, විමර්ශන සහ විමසීම් පැවැත්වීම පිළිබඳ සභාව සෑහීමට පත්වන අවස්ථාවල දී නියම කර ඇති ආකාරයෙන් එම හෝමියෝපති වෛද්‍ය සුදුසුකම් පිළිගැනීම සඳහා සභාව විසින් අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(4) සභාව විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මඟින් මෙහි නිශ්චිතව දක්වා ඇති දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි එවැනි සුදුසුකම් පිළිගත් බවට මහජනතාවට දැනුම් දිය හැකි ය

ශ්‍රී ලංකාවෙන් පිටත දී පිරිනමන ලද හෝමියෝපති වෛද්‍ය සුදුසුකම් පිළිගැනීම.

**24.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත යම් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද යම් හෝමියෝපති වෛද්‍ය සුදුසුකමක්, හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයේ හෝ එකී ආයතනයේ වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය ද, එම සුදුසුකම, එම රටේ උචිත නීතිරීති යටතේ පිළිගැනීම සඳහා වගකිව යුතු අනුමත අධිකාරයක් විසින් පිළිගත් සුදුසුකමක් ද යන කරුණු සැලකිල්ලට ගෙන, සභාව විසින් පිළිගනු ලැබිය හැකි ය.

(2) (අ) හෝමියෝපති වෛද්‍ය සුදුසුකම් පිළිගැනීම සඳහා රටවල් අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ යෝජනා ක්‍රමයක් සකස් කිරීම පිණිස ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටක (1) වන උපවගන්තියේ සඳහන් යම් අනුමත අධිකාරියක් සමග සාකච්ඡාවලට එළඹීමට සභාවට හැකි ය.

(ආ) සභාව විසින් එවැනි යෝජනා ක්‍රමයක් අනුගමනය කිරීමේ දී *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නිවේදනයක් මඟින් මෙහි නිශ්චිතව දක්වනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි

හෝමියෝපති වෛද්‍ය සුදුසුකමක් ලෙස එවැනි සුදුසුකමක් ඇතුළත් කිරීමට තමා අදහස් කරන බව මහජනතාව වෙත දැනුම් දිය හැකි ය.

(ඇ) (2) වන උපවගන්තියේ සඳහන් යම් අධිකාරියක් විසින් ප්‍රදානය කරන ලද යම් හෝමියෝපති වෛද්‍ය සුදුසුකමක් පිළිගැනීම සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී සභාවේ තීරණයෙන් අතෘප්තියට පත් එම විද්‍යාලය හෝ ආයතනය විසින් එකී තීරණය ලැබී සති දෙකක කාලයක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය. එකී අභියාචනය සලකා බැලීමෙන් පසුව සහ එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු වෙතොත් ඒවා සඳහන් කරනු ලැබූ වාර්තාවක් සභාවෙන් ලබාගැනීමෙන් පසු අමාත්‍යවරයා විසින් එම ප්‍රතික්ෂේප කිරීමේ තීරණය තහවුරු කිරීම හෝ නැතහොත් එම තීරණය වෙනස් කිරීම ද කරනු ලැබිය හැකි ය.

(3) සභාව විසින් (1) වන උපවගන්තියේ කාර්ය සඳහා වෛද්‍ය අධ්‍යාපන ප්‍රමිතීන් නිශ්චය කිරීමේ දී 27 වන වගන්තියේ සඳහන් නියම කරන ලද අවම අධ්‍යාපන ප්‍රමිතීන් පිළිබඳව සැළකිල්ලට ගනු ලැබිය යුතු ය.

සභාව විසින් වෛද්‍ය පරීක්ෂකවරුන් පත්කරනු ලැබිය හැකි බව.

**25.** (1) සභාව විසින් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයේ හෝ හෝමියෝපති ආයතනයේ උගන්වනු ලබන විෂයන් සම්බන්ධයෙන් ප්‍රවීණයන් බවට පත් තැනැත්තන්ගෙන් සභාවට අවශ්‍ය යයි සළකනු ලබන වෛද්‍ය පරීක්ෂකවරුන් යම් සංඛ්‍යාවක්-

(අ) හෝමියෝපති වෛද්‍ය විද්‍යා අධ්‍යාපනය ලබාදෙන යම් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ වෙනත් හෝමියෝපති ආයතනයක් පරීක්ෂා කිරීම සඳහා; සහ

(ආ) (i) හෝමියෝපති විද්‍යාලය හෝ ආයතනය විසින් සපයනු ලබන හෝමියෝපති වෛද්‍ය සුදුසුකමක් ප්‍රදානය කිරීමට හෝ පිරිනැමීමට හේතු වන්නා වූ අධ්‍යයන පාඨමාලාව;

(ii) එවැනි යම් සුදුසුකමක් ප්‍රදානය කිරීමේ හෝ පිරිනැමීමේ කාර්ය සඳහා එවැනි විද්‍යාලයක් හෝ ආයතනයක් පවත්වනු ලබන විභාග සඳහා අවශ්‍ය ප්‍රවීනතා මට්ටම;

(iii) එම අධ්‍යයන පාඨමාලාව සඳහා එම විද්‍යාලය හෝ ආයතනය සපයනු ලබන කාර්ය මණ්ඩලය, උපකරණ, නවාතැන් සහ පහසුකම්,

එම හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් සහ ආයතනයක් මගින් ප්‍රදානය කරනු ලබන හෝමියෝපති වෛද්‍ය සුදුසුකම් පිළිගැනීම සඳහා 27 වන වගන්තිය මගින් නියම කරන ලද අවම අධ්‍යාපන ප්‍රමිතීන් සමග අනුකූල වන්නේ ද, යන්න තහවුරු කිරීමේ කාර්ය සඳහා පරීක්ෂා කිරීම, විමර්ශනය කිරීම සහ විමසීම සඳහා පත්කරනු ලැබිය යුතු ය.

(2) එම වෛද්‍ය විද්‍යාලය හෝ ආයතනය භාරව සිටින සෑම තැනැත්තෙකු විසින් ම (1) වන උපවගන්තියේ සඳහන් එම පරීක්ෂකවරුන්ට එවැනි සියලු පරීක්ෂණ, විමර්ශන සහ විමසීම් පැවැත්වීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි එවැනි සියලු පහසුකම් සැලැස්විය යුතු ය.

(3) එකී වෛද්‍ය විද්‍යාලය හෝ ආයතනය විසින් පවත්වනු ලබන යම් පුහුණුවීම් හෝ විභාග සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂකවරුන් මැදිහත් නොවිය යුතු ය.

(4) යම් වෛද්‍ය පරීක්ෂකවරයකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් යම් විමර්ශනයක්, පරීක්ෂණයක් හෝ විමසීමක් කරනු ලබන අවස්ථාවක දී, තම තීරණය පිළිබඳ වාර්තාවක් ඔහු විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයට හෝ ආයතනයට සිය නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙස නියම කරමින් සභාව විසින් එම වාර්තාවේ පිටපතක් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයට හෝ ආයතනයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ නිරීක්ෂණ ලැබීමෙන් පසු සභාව විසින් අවස්ථාවෝචිත පරිදි විද්‍යාලයේ හෝ ආයතනයේ නිරීක්ෂණ සමග එකී වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

නියමිත ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාකිරීමට අසමත්වීමේ ප්‍රතිවිපාක.

**26.** (1) වෛද්‍ය පරීක්ෂකවරයකුගේ වාර්තාවක් සභාව වෙත ලැබීමෙන් පසු—

(අ) වෛද්‍ය සුදුසුකමක් ප්‍රදානය කිරීමට හෝ පිරිනැමීමට හේතුවන හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය හෝ හෝමියෝපති ආයතනය විසින් සපයනු ලබන අධ්‍යයන පාඨමාලා ; හෝ

(ආ) එවැනි සුදුසුකමක් ප්‍රදානය කිරීම හෝ පිරිනැමීමේ කාර්යය සඳහා එම වෛද්‍ය විද්‍යාලය හෝ ආයතනය විසින් පවත්වනු ලබන විභාග සම්බන්ධයෙන් නියම කර ඇති ප්‍රවීණතා මට්ටම; හෝ

(ඇ) එම අධ්‍යයන පාඨමාලා සඳහා ඒ වෛද්‍ය විද්‍යාලය හෝ ආයතනය සපයනු ලබන කාර්ය මණ්ඩලය, උපකරණ, නවාතැන්, සහ වෙනත් පහසුකම්,

නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූල නොවන බවට සභාව වෙත පෙනී යන්නේ නම්, සභාව විසින් මෙම පනතේ කාර්ය සඳහා එම සුදුසුකම් නොපිළිගත යුතු බවට අමාත්‍යවරයා වෙත නිර්දේශ කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ එම නිර්දේශ ලැබීමෙන් පසුව අමාත්‍යවරයා විසින් නිශ්චිත කාලයක් ඇතුළත ඒ සම්බන්ධයෙන් තම අදහස් දැක්වීම සඳහා එම හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයේ හෝ හෝමියෝපති ආයතනයේ අනුමත අධිකාරය වෙත එම නිර්දේශයේ පිටපතක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) යම් අදහස් ඇත්නම්, එම අදහස් ලැබීමෙන් පසු හෝ එම අදහස් නිශ්චිත කාලය ඇතුළත ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවන්හි දී අමාත්‍යවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි තවදුරටත් විභාග කිරීමෙන් පසු *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් එම වෛද්‍ය විද්‍යාලයට හෝ ආයතනයට සම්බන්ධ හෝ එම වෛද්‍ය විද්‍යාලයට හෝ ආයතනයට අනුබද්ධිත වෙනත් ආයතනයකට සම්බන්ධ එකී වෛද්‍ය සුදුසුකම එම නියමයේ නිශ්චිතව දැක්වෙන දිනයේ සිට පිළිගත් වෛද්‍ය සුදුසුකමක් වීම අවසන් වන බවට ප්‍රකාශයට පත් කළ යුතු ය.

අවම අධ්‍යාපන ප්‍රමිති.

**27.** හෝමියෝපති වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් වෛද්‍ය සුදුසුකමක් ප්‍රදානය කිරීම හෝ පිරිනැමීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝමියෝපති අධ්‍යයන පාඨමාලා පිළිබඳව හෝ එම විද්‍යාල හෝ ආයතන මගින් පවත්වනු ලබන විභාගවල දී අවශ්‍ය කරනු ලබන ප්‍රවීණතා මට්ටම් හෝ එම අධ්‍යයන පාඨමාලා සඳහා එම හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ ආයතන විසින් සපයනු ලබන කාර්ය මණ්ඩලය, උපකරණ, නවාතැන් සහ පහසුකම් පිළිබඳව වන අවම ප්‍රමිති සභාව විසින් නියම කළ යුතු ය.

පිළිගත් සුදුසුකම් ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද.

**28.** මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මේ පනත ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් බඳවා ගැනීමේ කාර්යය සඳහා සහ එම සුදුසුකම් දරන්නාගේ නම හෝමියෝපති නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහා සභාව විසින් පිළිගත් යම් හෝමියෝපති වෛද්‍ය සුදුසුකමක් එහි නිශ්චිතව සඳහන් කර ඇති සුදුසුකම එය දරන්නාට ප්‍රදානය කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

සභාව විසින් තොරතුරු සපයන ලෙස නියම කරනු ලැබිය හැකි බව.

**29.** පිළිගත් හෝමියෝපති වෛද්‍ය සුදුසුකම් ප්‍රදානය කරනු ලබන ශ්‍රී ලංකාවේ සෑම හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ ආයතනයක් විසින් ම සභාව වෙත කලින් කල නියම කරනු ලබන යම් තොරතුරු සපයනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## හෝමියෝපති ලේඛනය

හෝමියෝපති ලේඛනය.

**30.** (1) සභාව විසින් (මින්පසු මෙම කොටසෙහි "ලේඛනය" යනුවෙන් හඳුන්වනු ලබන) හෝමියෝපති ලේඛනයක් හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා නියම කරනු ලබන ආකාරයෙන් පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 1970 අංක 7 දරන හෝමියෝපති පනතේ 25 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලැබූ පොදු හෝමියෝපති ලේඛනය මෙම පනත යටතේ පවත්වා ගනු ලැබූ සහ තබා ගනු ලැබූ ලේඛනයක් ලෙස සැලකිය යුතු අතර එකී ලේඛනයේ නම ඇතුළත් කර ඇති සෑම තැනැත්තෙකු ම මෙම පනත යටතේ ලියාපදිංචි වූවකු ලෙස සැලකිය යුතු ය.

(3) හෝමියෝපති ලේඛනයේ නම ඇතුළත් තැනැත්තෙකු -

(අ) හෝමියෝපති වෛද්‍යවරයකු වශයෙන් රජයේ වෙනත් යම් කාර්යාලයක හෝ පළාත් පාලන හෝ වෙනත් අධිකාරයක් විසින් පවත්වා ගෙන යනු ලබන යම් ආයතනයක හෝ ධුරයක් දැරීමට;

(ආ) හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීමට;

(ඇ) යම් අධිකරණයක දී හෝ පරීක්ෂණයක දී හෝමියෝපති සම්බන්ධ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනත යටතේ විශේෂඥයකු වශයෙන් ඕනෑම සාක්ෂියක් ලබාදීමට;

සුදුසුකම් ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) ශ්‍රී ලංකාවේ හෝමියෝපති වෘත්තියේ යෙදීම සඳහා 1970 අංක 7 දරන හෝමියෝපති පනත යටතේ ලියාපදිංචි වූ හෝමියෝපති ලේඛනයේ නම ඇතුළත් හෝමියෝපති වෘත්තිකයන්ගේ අයිතිවාසිකම්වලට; සහ

(ආ) 1970 අංක 7 දරන හෝමියෝපති පනත යටතේ ලියාපදිංචි වූ හෝමියෝපති ලේඛනයේ නම ඇතුළත් වූ හෝමියෝපති වෘත්තිකයකුට පිරිනමන ලද (හෝමියෝපති වෘත්තියේ යෙදීම ඇතුලුව) වරප්‍රසාදවලට

කිසිවකට බල නොපෑ යුතු ය.

(5) සැක දුරුකිරීම සඳහා මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙර 1970 අංක 7 දරන හෝමියෝපති පනතේ 25 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ කිසියම් තැනැත්තෙකු මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ සිට එකී ලියාපදිංචි වීම මත මෙම පනතේ කාර්යය සඳහා හෝමියෝපති වෘත්තිකයකු ලෙස සැලකිය යුතු බව ප්‍රකාශ කරනු ලැබේ.

(6) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව සහ සභාව විසින් සාදන ලද යම් රීති ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන යෑම සභාවේ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය විය යුතු අතර, නියම කරනු ලබන ආකාරයට එම ලේඛනය යථාවත් කිරීම සහ පළ කිරීම කරනු ලැබිය යුතු ය.

(7) 35 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, ලේඛනයෙහි නම සඳහන් වී ඇති යම් තැනැත්තකු විසින් නියම කර ඇති ආකාරයට වසර පහකට වරක් තම ලියාපදිංචිය අලුත් කරනු ලැබිය යුතු ය.

(8) සාක්ෂි ආඥාපනතේ අර්ථානුකූලව එම ලේඛනය ප්‍රසිද්ධ ලේඛනයක් බවට සලකනු ලැබිය යුතු ය.

හෝමියෝපති වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා වන සුදුසුකම්.

31. (1) යම් තැනැත්තකු -

(අ) මනා චරිතයකින් යුක්ත;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන; සහ

(ඇ) හෝමියෝපති වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරන්නේ නම් මිස;

එම තැනැත්තා හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයකු ලෙස හෝමියෝපති ලේඛනයේ ලියාපදිංචි නොකළ යුතු ය.

(2) මෙම වගන්තියේ කාර්ය සඳහා -

(අ) "හෝමියෝපති වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධියක්" යන්නෙන් යම් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක හෝ ආයතනයක වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය සැලකිල්ලට ගෙන සභාව විසින් පිළිගනු ලබන ශ්‍රී ලංකාවේ හෝ විදේශයක විශ්වවිද්‍යාලයක් හා අනුබද්ධිත හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ ආයතනයක් මගින් ප්‍රදානය කරනු ලබන මාස හයකට නොඅඩු සීමාවාසික පුහුණු කාලසීමාවක් ඇතුළුව වසර හතරකට නොඅඩු අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමෙන් පසුව ලබා ගන්නා උපාධියක් අදහස් වේ.

(ආ) "ඩිප්ලෝමා" යන්නට සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් යම් නිර්ණායක ඇතුලු යම් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක හෝ ආයතනයක වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය සැලකිල්ලට ගෙන සභාව විසින් පිළිගනු ලබන ශ්‍රී ලංකාවේ හෝ විදේශයක විශ්වවිද්‍යාලයක් හා අනුබද්ධිත ආයතනයක් හෝ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් මගින් ප්‍රදානය කරනු ලබන මාස හයකට නොඅඩු සීමාවාසික පුහුණු කාල සීමාවක් ඇතුළුව වසර හතරකට නොඅඩු අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමෙන් පසු හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සම්බන්ධයෙන් ලබා ගන්නා ලද සම්පූර්ණ ඩිප්ලෝමාවක් ඇතුළත් වේ.

(3) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා සභාව විසින් වෛද්‍ය අධ්‍යාපන ප්‍රමිතීන් නිශ්චය කිරීමේ දී 27 වන වගන්තියේ සඳහන් වූ නියමිත අවම අධ්‍යාපන ප්‍රමිතීන් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

ලියාපදිංචිය සිදුකළ හැකි විශේෂ අවස්ථා.

**32.** (1) නියමිත දිනයේ දී හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ වසර පහකට නොඅඩු දැනුමක් සහ පළපුරුද්දක් සහිත ඕනෑම තැනැත්තෙකුට හෝමියෝපති වෘත්තිකයකු ලෙස ලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සභාව වෙත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) සභාව විසින් අයදුම්පත ලැබී අයදුම්පතෙහි වූ තොරතුරු සංක්ෂේපණය කිරීමෙන් මාස තුනක් ඇතුළත හෝමියෝපති වෘත්තියේ යෙදීම සඳහා එම තැනැත්තාගේ ප්‍රවීණතාව පරික්ෂාකිරීම සඳහා ලිඛිත පරික්ෂණයක් පැවැත්විය යුතු අතර එම තැනැත්තාගේ දැනුම සහ පළපුරුද්ද පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසු ඔහුගේ නම ලේඛනයට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පැවැත්වීමට නියමිත පරික්ෂණය ගැසට් පත්‍රයේ පලකරනු ලබන දැන්වීමක් මගින් නිවේදනය කළ යුතු ය.

(4) (2) වන උපවගන්තියේ සඳහන් ලිඛිත පරික්ෂණය නියමිත දිනයේ සිට වසර තුනක කාලයක් තුළ අවස්ථා තුනක දී පමණක් පවත්වනු ලැබිය යුතු ය.

හෝමියෝපති ඖෂධවේදීන්ගේ ලේඛනයක් පවත්වාගෙන යාම.

**33.** (1) සභාව විසින් හෝමියෝපති ඖෂධවේදී ලේඛනය යනුවෙන් හඳුන්වනු ලබන හෝමියෝපති ඖෂධවේදීන්ගේ ලේඛනයක් නියමිත ආකාරයට පවත්වාගෙන යාමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ලේඛනය පවත්වාගෙන යාම පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා වගකිව යුතු ය.

(3) අයදුම්කරුවකු විසින් හෝමියෝපති ඖෂධවේදීන්ගේ ලියාපදිංචි වීම සම්බන්ධයෙන් ලේඛනයෙහි නිශ්චිතව දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කරන අවස්ථාවක දී, එම තැනැත්තා විසින් නියමිත ආකාරයට කරන ලද ඉල්ලීමක් මත සභාව විසින් ඒ තැනැත්තාගේ නම හෝමියෝපති ඖෂධවේදී ලේඛනයේ ඇතුළත් කරනු ලැබිය යුතු ය.

වෘත්තිය චර්යාව සහ ආචාර ධර්ම මෙන්ම ආචාර ධර්ම සංග්‍රහය පිළිබඳ ප්‍රමිති.

**34.** සභාව විසින් හෝමියෝපති වෘත්තිකයන් සඳහා වෘත්තිය හැසිරීම සහ ආචාර ධර්ම මෙන්ම ආචාර ධර්ම සංග්‍රහයක ප්‍රමිතීන් පිළිබඳ රීති සාදනු ලැබිය හැකි අතර එම රීති මගින් අක්‍රමිකතා සහ වෘත්තිය විෂමාචාර සංයුක්ත වන ක්‍රියා පිළිබඳ නිශ්චිතව දැක්විය හැකි ය.

තැනැත්තන්ගේ නම් ලේඛනයෙන් ඉවත් කිරීම.

**35.** (1) සභාව වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව යම් ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයකු -

(අ) තම ක්‍රියාකාරී ලෙස හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදී නොසිටින බවට ; හෝ

(ආ) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අනුගමනය නොකරමින් සිටින බවට; හෝ

(ඇ) වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා හේතු වූ කිසියම් ඩිප්ලෝමා, උපාධි හෝ වෙනත් සහතික අහිමි වී ඇති බවට; හෝ

(ඈ) වෛද්‍ය වෘත්තිකයකු ලෙස කටයුතු කිරීමට නුසුදුසු බව පෙන්නුම් කෙරෙන යම් වරදකට වරදකරු වී ඇති බවට; හෝ

(ඉ) යම් අක්‍රමිකතාවක් හෝ වෘත්තිය විෂමාචාරයක් සම්බන්ධයෙන් වරදකරු වී ඇති බවට;

සභාවේ මතය වන අවස්ථාවක දී, සභාව විසින් (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ඔවුන්ගේ නම් ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(2) සභාව විසින් එම වෘත්තිකයන්ගේ නම් ලේඛනයෙන් ඉවත් කිරීමට පෙර ඉහත නිශ්චිතව දක්වන ලද හේතු මත ඔවුන්ගේ නම් ලේඛනයෙන් ඉවත් නොකළ යුත්තේ මන්දැයි යන්නට ලිඛිතව හේතු සැපයීමට ඔවුන්ට අවස්ථාව ලබා දිය යුතු ය.

(3) ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයින් විසින් ලබාදෙන ලද හේතු පිළිබඳ සභාව සෑහීමකට පත් නොවන අවස්ථාවලදී සහ නියම කරන ලද ආකාරයට නියමිත පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව ලේඛනයෙන් සහ එයට සම්බන්ධ අනෙකුත් සියලුම සටහන්වලින් නම ඉවත් කිරීම සඳහා සභාව විසින් නියම කරනු ලැබිය යුතු ය.

(4) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාව විසින් එසේ ලේඛනයෙන් ඉවත් කරන ලද වෘත්තිකයාගේ නම *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් හේතුව හැර එම උපවගන්තියේ සඳහන් අනෙකුත් හේතු මත යම් තැනැත්තකුගේ නම ලේඛනයෙන් ඉවත් කර ඇති අවස්ථාවක දී සහ එම තැනැත්තා විසින් නම නැවත ලේඛනයට ඇතුළත් කර ගැනීම සඳහා කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප වී ඇති අවස්ථාවක දී නියමිත ආකාරයෙන් ඔහු විසින් අමාත්‍යවරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(6) එම අභියාචනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය විය යුතු ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා "ප්‍රධාන වෘත්තිය" යන්නෙන් වෙනත් වෛද්‍ය ක්‍රම අනුගමනය නොකර පිළිගත් හෝමියෝපති වෛද්‍ය මූලධර්මවලට අනුකූලව හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම අදහස් වේ.

**ඇතැම් පිළිගත් වෛද්‍ය සුදුසුකම් සතු යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්.**

**36.** හෝමියෝපති වෘත්තියෙහි යෙදීම හා සම්බන්ධයෙන් මේ පනතෙහි නිශ්චිතව දක්වා ඇති කොන්දේසි සහ සීමාවන්ට යටත්ව හෝමියෝපති ලේඛනයෙහි ලියාපදිංචි සෑම තැනැත්තකු හට ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම සඳහාත් ලබා දුන් ප්‍රතිකාර වෙනුවෙන් යම් ගාස්තු අයකිරීම සඳහාත් හිමිකමක් තිබිය යුතු ය.

**"නීත්‍යානුකූල හෝ නිසි පරිදි සුදුසුකම්ලත් හෝමියෝපති වෘත්තිකයා" යන්නෙහි අර්ථය.**

**37.** යම් ලිඛිත නීතියක කාර්යය සඳහා "ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයකු" යන වචන වලින් මෙම පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝමියෝපති වෘත්තිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

**අමතර තනතුරු ඩිප්ලෝමා හෝ වෙනත් සුදුසුකම් ඇතුළත් කිරීම.**

**38.** ලේඛනයෙහි නම සඳහන් යම් තැනැත්තකු විසින් යම් පදවි නාමයක්, ඩිප්ලෝමාවක් හෝ පිළිගත් වෛද්‍ය සුදුසුකමක් වන්නා වූ හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණතාව සඳහා වූ වෙනත් සුදුසුකමක් ලබාගෙන සිටින අවස්ථාවක, නියම කර ඇති ආකාරයෙන් තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මඟින් ඒ තැනැත්තාට හෝමියෝපති ලේඛනයේ තම නම ඉදිරියෙන් කලින් කරන ලද සඳහන් කිරීමට ආදේශකයක් ලෙස හෝ එකතු කිරීමක් ලෙස එම වෙනත් පදවි නාමය, ඩිප්ලෝමාව හෝ වෙනත් සුදුසුකම ඇතුළත් කිරීමට හිමිකමක් තිබිය යුතු ය.

**තම පදිංචි ස්ථානය මාරුකිරීම දැන්විය යුතු බව.**

**39.** ලේඛනයෙහි ලියාපදිංචි වී ඇති සෑම තැනැත්තකු ම තම පදිංචි ස්ථානයේ යම් වෙනස් වීමක් හෝ වෘත්තීය ස්ථානයේ වෙනස් වීමක් සභාව වෙත එකී වෙනස් වීමේ දින සිට දින තිහක් ඇතුළත දැනුම් දෙනු ලැබිය යුතු ය. එම වෙනස දැනුම් දීමට එම සාමාජිකයා අපොහොසත් වන අවස්ථාවක දී, සභාවට සාමාජිකයන් තෝරා ගැනීම සඳහා වූ ඡන්ද විමසීමට සහභාගි වීමේ අයිතිය ඔහුට නොතිබිය යුතු ය.

**ලියාපදිංචි නොවූ හෝමියෝපති වෘත්තිකයකු ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයකු බවට ඇඟවීම හෝ වාසි සඳහා හෝමියෝපති වෘත්තිකයකු ලෙස වෘත්තියේ යෙදීම වරදක් වන බව.**

**40.** (1) ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයකු නොවන යම් තැනැත්තකු විසින්-

(අ) "ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයා" යන පදවි නාමය සිංහල භාෂාවෙන් හෝ ඒ අදහස එන වෙනත් යම් භාෂාවකින් තනිව හෝ වෙනත් යම් වචන හෝ අක්ෂර සමඟ මිශ්‍ර කර හෝ භාවිතා කරන්නේ නම්; හෝ

(ආ) එම තැනැත්තා ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයකු වන බව අඟවන වෙනත් යම් පදවි නාම, එකතු කිරීම් හෝ විස්තර කිරීම් භාවිතා කරන්නේ නම්; හෝ

(ඇ) ලාභයක් ලැබීමේ අදහසින් හෝමියෝපති වෘත්තියේ යෙදෙන්නේ නම්; හෝ

එම තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබයි.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සිදු කරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු රුපියල් පනස් දහසකට නොඅඩු දඩයකට හෝ මාස හයක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ එම බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

## VII වන කොටස

## මුදල් සහ ගිණුම්

**සභාවේ අරමුදල**

**41.** (1) (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවේ "හෝමියෝපති අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සභාවේ අරමුදලට පහත දැක්වෙන මුදල් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම මගින් ලැබෙන සියලු මුදල්;

(ආ) පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ඈ) හෝමියෝපති වෘත්තිකයන්ගෙන් සහ විභාගවලට පෙනී සිටින තැනැත්තන්ගෙන් ලැබෙන යම් ගාස්තු ;

(ඇ) සභාවට ලැබෙන යම් ණය සහ වෙනත් මුදල් ; සහ

(ඉ) ශ්‍රී ලංකා රජයෙන් හෝ විදේශ රටකින් ලැබෙන මුදලින් හෝ අන්‍යාකාරයකින් වූ යම් ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ පරිත්‍යාගයක්:

එසේ වුවද, යම් විදේශ රටකින් සභාව වෙත ලැබෙන යම් ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ පරිත්‍යාගයක් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය හා ගිණුම් විගණනය.

**42.** (1) සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සභාව විසින් සභාවේ ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් මෙන්ම වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සභාවේ ගිණුම් විගණනයට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VIII වන කොටස

## විවිධ

(105 වන අධිකාරය) වෛද්‍ය ආඥාපනත ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයන්ට අදාළ නොවිය යුතු ය.

**43.** හෝමියෝපති වෛද්‍ය විද්‍යාවට අනුකූලව වෛද්‍ය වෘත්තියේ, ඖෂධවේදයේ හෝ හෙද සේවයේ යෙදෙන තැනැත්තන්ට (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

සභාව විසින් අමාත්‍යවරයා වෙත වාර්තා ආදිය භාරදිය යුතු බව.

**44.** (1) එක් එක් මුදල් වර්ෂයේ අවසානයෙන් පසු එළඹෙන මාස තුන ඇතුළත සභාව විසින් එම මුදල් වර්ෂය ඇතුළත ඉටු කරන ලද කටයුතු පිළිබඳ මාසික වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම වර්ෂයට අදාළ පහත දැක්වෙන ලේඛන එම වාර්තාවට අමුණා ඉදිරිපත් කිරීමට සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය-

(අ) වර්ෂය සඳහා වූ සභාවේ විගණනය කරන ලද ගිණුම් වාර්තාව සහ එම ගිණුම් වාර්තාව අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ යෝජිත කටයුතු පිළිබඳ වාර්තාවක් ;

(ආ) ක්‍රියාකාරී සැලසුම , ආයතනික සැලසුම, කාර්ය සාධන වාර්තාව සහ අමාත්‍යවරයාට අවශ්‍ය විය හැකි වෙනත් තොරතුරු.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉහත කී වාර්තා අමාත්‍යවරයා වෙත ලැබුණු දින සිට මාස හයක් ඇතුළත අමාත්‍යවරයා විසින් එම ලේඛන වල පිටපත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සභාව රේගු සහ වෙනත් බදු ආදියෙන් නිදහස් කරනු ලැබිය හැකි බව.

**45.** 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව හෝ අවස්ථාවෝචිත පරිදි යම් බදු , ගාස්තු හෝ බදු මුදල් පැනවීම පාලනය කරනු ලබන තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීති ප්‍රකාරව අවසර දී ඇති තාක් දුරට සියලු බදු, ගාස්තු සහ බදු මුදල් සභාවේ ආදායම හෝ ලාභ මත ගෙවීමෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් සභාව නිදහස් කරනු ලැබිය හැකි ය.

සභාවට එරෙහිව කරන ලද පැමිණිලි.

**46.** (1) මේ පනතේ යම් විධිවිධානවලට අනුකූලව සභාව ක්‍රියා නොකරන බවට අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක දී හෝ සභාවට විරුද්ධව පැමිණිල්ලක් ලැබීමේ දී අමාත්‍යවරයා විසින් එම අනනුකූලත්ව කරුණ හෝ පැමිණිල්ල අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරනු ලැබිය හැකි අතර ලේකම්වරයා විසින් එකී පැමිණිල්ල විභාග කර අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු ය. ලේකම්වරයා විසින් උචිත යයි සලකනු ලබන නිර්දේශ එකී වාර්තාව සමඟ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නිර්දේශ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අවස්ථාවක දී, ලේකම්වරයා විසින් යම්

කාලසීමාවක් ඇතුළත එසේ කරනු ලැබූ නිර්දේශ අනුගමනය කරන ලෙස සභාව වෙත නියම කරනු ලැබිය හැකි අතර, සභාව එකී නියම වලට එකඟව ක්‍රියාකිරීම පැහැර හරින්නේ නම්, එකී නිර්දේශ බලාත්මක කිරීම සඳහා ඔහු විසින් නියමයක් කරනු ලැබීම හෝ අවශ්‍යයයි සලකනු ලබන වෙනත් පියවර ගැනීම කරනු ලැබිය හැකි ය.

(3) සභාව විසින් යම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පැහැර හරින අවස්ථාවක, පනතේ අදාළ විධිවිධානවලට එකඟව ක්‍රියාකිරීමට සභාවට විධාන කිරීමට ලේකම්වරයාට බලය තිබිය යුතු ය.

ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම සහ විකිණීම සඳහා වූ හෝමියෝපති ඒකක ලියාපදිංචි කළ යුතු බව.

**47.** (1) තත්කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත අවස්ථාවෝචිත පරිදි හෝමියෝපති ඖෂධ නිෂ්පාදන ඒකකයක්, ඖෂධ අලෙවි සැලක්, ඖෂධ ගබඩාවක් හෝ ඖෂධ අලෙවි කරන ස්ථානයක් ලෙස අධ්‍යක්ෂවරයා විසින් යම් පරිශ්‍රයක් මේ පනත යටතේ නියම කර ඇති ආකාරයට තත්කාලයේ ලියාපදිංචි කර ඇත්නම් මිස, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා නියම කරන ලද දිනයක සිට සහ ඉන් පසුව හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය කිරීමේ, ගබඩා කිරීමේ සහ විකිණීමේ කාර්ය සඳහා කිසිදු පරිශ්‍රයක් භාවිතා කරනු නොලැබිය යුතු ය.

(2) නියමිත දිනය (1) වන උපවගන්තිය යටතේ වූ නියමය පළකිරීමේ දිනයට පසුව එළඹෙන මාස තුනකට පෙරාතුවම දිනයක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තෙක් වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පනස්දහසකට නොඅඩු දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම එම තැනැත්තා යටත් විය යුතු යුතු ය.

අමාත්‍යවරයා විසින් විධාන නිකුත් කිරීම.

**48.** සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල සභාව වෙත ලිඛිතව සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, එකී විධාන බලාත්මක කිරීම සභාවේ කාර්ය වන්නේ ය.

නියෝග.

**49.** (1) පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා මේ පනත මඟින් නියම කළ යුතු යයි නියමිත යම් කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ සෑදීමට නියම කර ඇති හෝ බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත පවරා ඇති බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැතිව සහ විශේෂයෙන්ම අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි යː-

(අ) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන්,හෝමියෝපති වෛද්‍ය ආයතන, හෝමියෝපති නිෂ්පාදන ඒකක, අලෙවි මධ්‍යස්ථාන, ලියාපදිංචි කළ යුතු ආකාරය, ඉල්ලුම් පත්‍ර, ගෙවිය යුතු ගාස්තු සහ ලියාපදිංචි කිරීමේ කාල සීමාව;

(ආ) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම, අලුත් කිරීම, අත්හිටුවීම හෝ ලියාපදිංචිය අවලංගු කිරීම සිදු කරනු ලබන ආකාරය;

(ඇ) සභාවේ සභාපතිවරයා, උපසභාපතිවරයා සහ සාමාජිකයන් තෝරාපත් කළ යුතු ආකාරය;

(ඈ) ලියාපදිංචි හෝමියෝපති නිෂ්පාදන ඒකක, ඖෂධ ශාලා, අලෙවි මධ්‍යස්ථාන හෝ ගබඩා සම්බන්ධයෙන් අනුකූල විය යුතු නියම සහ කොන්දේසි;

(ඉ) ලියාපදිංචි හෝමියෝපති නිෂ්පාදන ඒකක, ඖෂධ ශාලා, අලෙවි මධ්‍යස්ථාන හෝ ගබඩා සම්බන්ධයෙන් වාර්තා සහ පොත් තබාගත යුතු ආකාරය;

(ඊ) ලියාපදිංචි හෝමියෝපති නිෂ්පාදන ඒකක, ඖෂධ ශාලා, අලෙවි මධ්‍යස්ථාන හෝ ගබඩා සම්බන්ධයෙන් කලින් කල වාර්තා සැපයිය යුතු ආකාරය සහ එම වාර්තාවල අඩංගු විය යුතු කරුණු;

(උ) ලියාපදිංචි හෝමියෝපති නිෂ්පාදන ඒකක, ඖෂධ ශාලා, අලෙවි මධ්‍යස්ථාන හෝ ගබඩා නිසි ලෙස පවත්වාගෙන යා යුතු ආකාරය සහ පරිපාලනය කරනු ලැබිය යුතු ආකාරය;

(උෟ) සභාවේ සාමාජිකයන් තෝරා ගැනීමේ අරමුණින් සභාවේ කමිටුවල රැස්වීම් කැඳවීම සහ එම රැස්වීම් පැවැත්විය යුතු ආකාරය;

(එ) මෙම පනත යටතේ යම් තැනැත්තකුට ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලැබීම පිණිස හේතු වන යම් සුදුසුකමක් ප්‍රදානය කිරීමේ හෝ පිරිනැමීමේ කාර්යය සඳහා යම් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක හෝ වෙනත් ආයතනයක හැදෑරිය යුතු පාඨමාලා, විභාග, කාර්ය මණ්ඩලය, උපකරණ, නවාතැන් පහසුකම් පුහුණුව සහ වෙනත් පහසුකම් ඇතුලත් අවම ප්‍රමිති ;

(ඒ) හෝමියෝපති ඖෂධවේදියෙකු වශයෙන් ඇතුළත් කර ගැනීමට සපුරාලිය යුතු සුදුසුකම් සහ නිර්ණායක;

(ඔ) වෘත්තිය විභාග පැවැත්වීම, විභාග පරීක්ෂකවරුන්ගේ සුදුසුකම් සහ එම විභාගවලට ඇතුල්වීමේ කොන්දේසි.

සභාවේ සියලු නිලධරයන් සාමාජිකයන් සහ සේවා නියුක්තිකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**50.** සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන්, සේවා නියුක්තිකයන් දණ්ඩ නීති සංග්‍රහයේ (19 වන අධිකාරය වූ) අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**51.** සභාව අල්ලස් පනතේ (26 වන අධිකාරය වූ) අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය.

ඉවත් කිරීම සහ ව්‍යාවර්ථන.

**52.** (1) 1970 අංක 7 දරන හෝමියෝපති පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී පනත ඉවත් කිරීම නොතකා -

(අ) ඉවත් කරන ලද පනතේ 39 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලේ බැරට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින සියලු මුදල්, මේ පනත යටතේ පිහිටුවනු ලබන සභාවේ අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය;

(ආ) සභාව විසින් හෝ සභාවට එරෙහිව යම් අධිකරණයක හෝ විනිශ්චය සභාවක මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පැවති සියලු නඩු සහ නීති කෘත්‍යයන් සභාව විසින් හෝ සභාවට එරෙහිව පනවා ඇති නඩු සහ නීති කෘත්‍යයන් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒවා ඒ අනුව අඛන්ඩව පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඇ) සභාවේ වාසියට හෝ සභාවට එරෙහිව යම් නිසි බලය ඇති අධිකරණයක් විසින් ඇතුළත් කරන ලද හෝ කරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම් ආරම්භ වන දිනයේ දී ඉටු නොකර ඉතිරිව ඇති සියලු තීන්දු ප්‍රකාශ සහ ආඥා අවස්ථාවෝචිත පරිදි, සභාවේ වාසියට හෝ සභාවට එරෙහිව ඇතුළත් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශ බවට සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කළ යුතු ය.

(ඈ) ඉවත් කරන ලද පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සහ මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී බලාත්මකව පැවති සෑම නියෝගයක් ම මේ පනත යටතේ දෙන ලද නියෝගයක් වශයෙන් සැලකිය යුතු අතර මේ පනත ප්‍රකාරව නියෝග සාදනු ලබන තෙක්, මේ පනත යටතේ සාදන ලද නියෝග ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඉ) ඉවත් කරන ලද පනත යටතේ රජය විසින් පාලනය කරනු ලබන්නා වූ ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයේ දී ක්‍රියාත්මකව පවතින්නා වූ ද හෝමියෝපති රෝහල මේ පනත යටතේ පිහිටුවනු ලැබූ රෝහලක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී රෝහල ඒ අනුව පවත්වාගෙන යා යුතු ය.

**හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව.**

**53.** (1) 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු (මෙහි මින්මතු "අතුරු සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන ) අතුරු වෛද්‍ය සභාවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු යः-

(අ) 2 (3) (අ) වගන්තියේ දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයින් ;

(ආ) ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයින් හතර දෙනකු; සහ

(ඇ) නීති, වෛද්‍ය හෝ විද්‍යා යන ක්ෂේත්‍රවල සාධනය කළ දැනුමක්, පුහුණුවක් හා විශිෂ්ඨත්වයක් සහිත කීර්තිමත් තැනැත්තන් තුන් දෙනකු.

(2) අතුරු සභාව විසින් මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ සිට වසර දෙකක් තුළ සභාව පිහිටුවන තුරු සභාවේ කර්තව්‍යයන් ඉටු කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් නියමිත දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලයක් සඳහා අතුරු සභාව පත් කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සාමාජිකයන් අතුරින් අතුරු සභාවේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ විධිවිධානයන්ට යටත්ව, අමාත්‍යවරයා විසින් සභාව පත් කරන තුරු අතුරු සභාවේ සාමාජිකයින් ධුර දැරිය යුතු ය.

(6) අතුරු සභාවේ රැස්වීමක ගණපූරණය පස් දෙනෙකු විය යුතු ය.

**අර්ථ නිරූපනය.**

**54.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ -

"කොමිෂන් සභාව" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ;

"සභාව" යන්නෙන් 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද හෝමියෝපති වෛද්‍ය සභාව අදහස් වේ;

"උපාධි ප්‍රදාන ආයතනය" යන්නට 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"බෙහෙත් ශාලාව" යන්නෙන් (ඕනෑම ආකාරයකට විස්තර කර ඇති) රෝගවලින් පෙළෙන තැනැත්තන් සඳහා බාහිර ප්‍රතිකාර කිරීම සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන ලෙස සලකනු ලබන යම් පරිශ්‍රයක් අදහස් වේ;

"හෝමියෝපති" යන්නෙන් වෛද්‍ය හැන්මන් විසින් ස්ථාපනය කරන ලද වෛද්‍ය ක්‍රමයක් සහ එම ක්‍රමයට අනුව සකස් කරන ලද ඖෂධ භාවිත කරනු ලබන වෛද්‍ය ක්‍රමයක් සහ නූතන දියුණු විද්‍යාත්මක හා තාක්ෂණික ක්‍රම භාවිතයෙන් රෝග සායනිකව කළමනාකරණය කිරීම සඳහා, රෝග වැළැක්වීම සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා දියුණු ක්‍රම භාවිත කරන ක්‍රමයක් අදහස් වන අතර එයට ජීව රසායනික ප්‍රතිකර්ම, ස්වභාවික ප්‍රතිකර්ම, බැච් ෆ්ලවර් ප්‍රතිකර්ම (Batch Flower ප්‍රතිකර්ම), මානව ආත්මාරෝපිත බෙහෙත් (anthro pomorphically බෙහෙත්) යනාදිය මනුෂ්‍ය තත්වාරෝපණය කරන ලද ඖෂධ පාවිච්චි කිරීම ද ඇතුළත් වේ;

"හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය" යන්නෙන් හෝමියෝපති හෝ ඊට සම්බන්ධ විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව උපාධියක්, ඩිප්ලෝමාවක් හෝ වෙනත් කිසියම් සුදුසුකමක් ප්‍රදානය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පිහිටුවන ලද හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ යම් පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාවක් හෝ පුහුණුවක් සහ වෙනත් සියලු පාඨමාලා ඇතුලු යම් අධ්‍යයන පාඨමාලාවක් හෝ පුහුණුවක් යම් තැනැත්තකු වෙත ලබාදෙන හෝමියෝපති යන නමින් හෝ වෙනත් යම් නමකින් හඳුන්වනු ලබන යම් හෝමියෝපති විද්‍යාලයක් අදහස් වේ;

"හෝමියෝපති ආයතනය" යන්නෙන් ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත හෝ හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හෝ ඊට සම්බන්ධ විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව උපාධි, ඩිප්ලෝමා හෝ වෙනත් කිසියම් සුදුසුකමක් ප්‍රදානය කරන හෝමියෝපති වෛද්‍යවිද්‍යාලය නොවන වෙනත් යම් ආයතනයක් අදහස් වන අතර විශ්වවිද්‍යාලයක් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් සහ මේ පනතේ 22 වන වගන්තියේ සඳහන් ආයතනයක් ද ඊට ඇතුළත් වේ;

"හෝමියෝපති වෛද්‍ය සුදුසුකම" යන්නෙන් මෙම පනත යටතේ ලියාපදිංචි වීමට යම් තැනැත්තකු හිමිකම් ලබන හෝමියෝපති වෛද්‍ය විද්‍යා සුදුසුකම් අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය යන විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වන අතර අමාත්‍යාංශය යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතු ය;

"ඖෂධ ශාලාව" යන්නට හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය කරනු ලබන, පිළියෙල කරනු ලබන හෝ ඒකාබද්ධ කරනු ලබන යම් නිෂ්පාදන ඒකකයක් ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලබන යන්න අදහස් වේ;

"පිළිගත් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය හෝ ආයතනය" යන්නෙන් වෛද්‍ය විද්‍යා සුදුසුකමක් ප්‍රදානය කරනු ලබන හෝ පිරිනමනු ලබන සභාව විසින් පිළිගනු ලැබූ යම් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ ආයතනයක් අදහස් වේ;

"හෝමියෝපති ලේඛනය" යන්නෙන් මේ පනතේ 30 වන වගන්තිය යටතේ සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය අදහස් වේ;

"ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරයා" යන්නෙන්,1970 අංක 7 දරන හෝමියෝපති පනතේ 25 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන සාමාන්‍ය ලේඛනයට අනුව ලියාපදිංචි වී ඇති සහ මෙම පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"රීති" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද රීති අදහස් වේ;

"විශ්වවිද්‍යාල" යන්නට 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අර්ථානුකූලව පිහිටුවනු ලැබූ හෝ සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක් අදහස් වේ;

අනනුකූලතාවක් ඇති වුව හොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**55.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි